# ජේසුස් වහන්සේ
# දේව මාලිගාවේ ප්‍රධානීන් සමග
# සහ
# නිකදේමුස්ගේ ප්‍රශ්න වලට
# ජේසුස් වහන්සේගේ පිළිතුරු



පරිවර්තනය - www.subaasna.com

දිනක් ජේසු තුමා දේව මාලිගාවට ගිය විට
මිනිසුන් දේව මාලිගාව වෙළඳපොලක් කරගෙන ඉන්නවා දැක්කා.
ඔවුන් සතුන් වෙළදාමේ යෙදෙමින් මුදල් හුවමාරු කරගනිමින් සිටියා.




6.1

ජේසු තුමන් ලණුවලින් කසයක් සාදාගෙන සතුන් වෙළදාම් කරන්නන් සියල්ලන් දේව මාලිගාවෙන් පිටතට පලවා හැර , මුදල් මාරු කරන්නන්ගේ කාසි විසුරුවා ඔවුන්ගේ මේස පෙරළා දැම්මා. ඉන්පසු ජේසු තුමා කථා කරමින් “මේවා අහකට ගෙන යන්න, මාගේ පියාණන්ගේ ගෘහය වෙළඳ පොළක් නොකරන්නයි” කිව්වා.



6.2



දේව මාළිගාවේ ප්‍රධානීන් මේ දැක ඔබ
මේ දේවල් කරන බැවින් ලකුණක්
පිණිස කුමන හාස්කමක් අපට
දක්වන්නෙහිදැයි ඇහුවා.
ජේසු තුමන් ඔවුන්ට කථා කරමින් මේ
දේව මාලිගාව කඩාදමන්න. තෙදිනකින්
එය මම ගොඩනඟන්නෙමි කිව්වා.
ඔවුන් පිළිතුරු දෙමින් දේව මාලිගාව
ගොඩනඟන්නට හතළිස් හය වසක්
ගත වුනා කියල කිව්වා.

6.3

නමුත් ජේසු තුමන් කියා සිටියේ
තමන්ගේ ශරීරය නමැති දේව මාලිගාව
ගැනයි. ජේසු තුමන්ගේ මරණයත්,
නැවත දින තුනකින් උත්ථාන වීමත්
ගැනයි ජේසු තුමන් කිව්වේ.
මරණීන් නැඟිටුවනු ලැබූ පසු,
ජේසු තුමන්ගේ ගෝලයෝ
උන්වහන්සේ මේ දේ කී බව
සිහි කොට ශුද්ධ ලියවිල්ල ද
උන් වහන්සේගේ වචනය ද
විශ්වාස කළා.



6.4



දිනක් රාත්‍රීයේ පරිසිවරුන්ගෙන්
කෙනෙක් වූ ද, ජුදෙව්වරුන්ගේ
ප්‍රධානියෙක් වූ ද නිකදේමුස්
කියන තැනැත්තා ජේසු තුමන්
හමු වෙන්න ආවා.
ඔහු දැනගෙන හිටියා
ජේසු තුමන් කියන්නේ දෙවියන්
වහන්සේ වෙතින් වැඩම කළ
අයෙක් කියලා.
ඔහු ආවේ දෙවියන් වහන්සේ
ගැන ඉගෙන ගන්නයි.

6.5



ජේසු තුමන් කථා කරලා කිව්වා
යමෙක් නැවත නූපන්නොත්, ඔහුට
දෙවියන් වහන්සේගේ රාජ්‍යය
දැකගත නොහැකියි කියල.
නිකදේමුස්ට මේ දේ තේරුනේ
නැහැ. ඔහු ඇහුවා මනුෂ්‍යයෙකු
මහලු ව සිටිය දී, උපදින්නට
පුළුවන් කොහොම ද?
දෙවන වරටත් මවු කුසට පිවිස
උපත ලැබිය හැකි දැයි කියල.

6.6



ජේසු තුමන් උත්තර දීල මෙහෙම කිව්වා. යමෙකු වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත්, ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය කියලා.
ආත්මයාණන් කියන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේටයි.
ශුද්ධාත්මයාණන් වහන්සේ හරියට සුළඟ වගේ. අපිට පෙන්නේ නැහැ, හැබැයි අපිට දැනෙනවා , සුළඟින් වෙන දේ අපිට පේනවා වගේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරුණු අයගේ බලය අපිට පේනවා.


6.7



ජේසු තුමා නිකදේමුස්ට මතක් කළා ඊශ්‍රායෙල් ජනයා පොරොන්දු දේශයට යන ගමනේදී කෑම , වතුර ආදිය ගැන මෝසෙස් තුමාට චෝදනා කළ ආකාරය.

6.8


ඒ මිනිසුන්ගේ වැරදි ක්‍රියා නිසා දෙවියන් වහන්සේ ඔවුන්ට
සර්පයින් එවලා දඬුවම් දුන් ආකාරය ජේසු තුමා මතක් කලා.
6.9


මේ දඬුවම දැකල මිනිස්සු කිව්වා අපි වැරදි කළා,
අපි වෙනුවෙන් දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න කියල
ඔවුන් මෝසෙස් තුමාගෙන් ඉල්ලුවා.
මෝසෙස් තුමා ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළා.
නමුත් දෙවියන් වහන්සේ ඒ සර්පයින්
ඔවුන්ගෙන් ඈත් කලේ නැහැ.
6.10


ඒ වෙනුවට දෙවියන් වහන්සේගේ බලය ඔවුන්ට
දැනෙන්න දෙවියන් වහන්සේ කිව්වා
මෝසෙස්ට සර්පයෙක්ගේ අනුරුවක් හදල
ඇත්ත සර්පයෙක් කාපු කෙනෙක් ඉන්නවනම්
ඔහුට මේ සර්ප අනුරුව ඉස්සරහට එන්න,
එතකොට ඔහු සුව වෙනවා කියල.
6.11


ජේසු තුමන් නිකදේමුස්ට
කිව්වා පාළුකරයෙහි දී
මෝසෙස් සර්පයා මෙසේ
එසෙව්වා වගේම ජේසු තුමත්
මිනිසුන්ගේ පවු වෙනුවෙන්
එසවෙන්න ඕනි කියල.
6.12


ජේසු තුමන් කිව්වා දෙවියන් වහන්සේ
කොච්චර මිනිසුන්ට ප්‍රේම කරනවද
කියනවනම් තමන්ගේ එකම පුත්‍රයාණනුත්
මේ ලෝකයට එව්වා ඔවුන් වෙනුවෙන්
කියල. එහෙම කලේ උන්වහන්සේව
අදහන අය විනාශ වෙන්නේ නැතුව
සදාතන ජීවිතය ලබන්න
ඕනි හින්ද කියල.
6.13


ඒ කියන්නේ අපි ජේසුස් වහන්සේව
විශ්වාස කරනවා කියන්නේ
දෙවියන් වහන්සේගේ දරුවෙක් කියල.
6.14

නිකදේමුස් ජේසුගේ ගෝලයෙක් උනේ නැති වෙන්න පුළුවන්. නමුත් ඔහු ජේසු තුමන්ට දැක්වූ ආදරය පෙන්නුම් කළා ජේසු තුමන්ගේ උකුත්වීමත් සමගම ජේසු තුමන්ගේ ශ්‍රී ශරීරය අරගෙන ගිහින් තැම්පත් කල සිද්ධිය තුළ.




ඉන්පසු ජේසු තුමන් සහ ගෝලයින් දෙවියන් වහන්සේ ගැන කියල දෙන්න අනිත් පැති වලටත් ගියා. ජේසු තුමන් එසේ ගිහින් ගොඩක් අයට දේශනා කළා.

